පොලිස්පති නිල කාර්යාලය

RTM-540 CRTM-364

2022.05.23

පොලිස්පති ගෙන් සියලු ම :
: ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්
: නියෝජ්‍ය පොලිස්පතිවරුන්
: අණදෙන නිලධාරීන් / අධ්‍යක්ෂවරුන්
: කොට්ඨාස භාර නිලධාරීන්
: දිස්ත්‍රික් භාර ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිවේදින නිලධරයන්
: මූ.පො.ප. / ස්ථානාධිපතිවරුන්

1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ රඳවා ගැනීමේ නියෝග ලබා ගැනීම

1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධව විමර්ශන සිදුකර යම් සැකකරුවකු අත්අඩංගුවට ගැනීමට අදාළ විශේෂිත විධිවිධාන එම පනතේ ඇතුළත් කර ඇත.

ඒ අනුව, යම් සංඥය වරදක් විමර්ශනය කරන විමර්ශන නිලධරයකු විසින් එම විමර්ශනයට අදාළ සැකකරුවකුට එරෙහිව සාධාරණ පැමිණිල්ලක්, විශ්වාසදායී තොරතුරක් හෝ සාධාරණ සැකයක් පවතින අවස්ථාවක දී හෝ එවැනි සැකකරුවකු සංඥය වරදක් සිදු කළ බවට අනාවරණය වී ඇති අවස්ථාවක දී එවැනි සැකකරුවකු වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගත හැකි ය.

එසේ වුව ද, ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධව යම් සැකකරුවකු අත්අඩංගුවට ගැනීමේ දී, පොලිස් අධිකාරී නිලයට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරයකු හෝ එවැනි නිලධරයකු විසින් උප පොලිස් පරීක්ෂක වරයකු හෝ ඉන් ඉහළ නිලධරයකුට කරනු ලබන ලිඛිත නියෝගයක් මත පමණක් එවැනි යම් සැකකරුවකු අත්අඩංගුවට ගැනීමට බලය ලැබේ.

එලෙස සැකකරුවකු අත්අඩංගුවට ගත් පසු අත්අඩංගුවට පත් වේලාවේ සිට උපරිම පැය 72 ක කාලයක් විමර්ශන කටයුතු සඳහා අත්අඩංගුවේ තබා ගනු ලැබිය හැකි අතර, එම කාලය ඉක්මවා තවදුරටත් යම් පොලිස් ස්ථානයක් තුළ හෝ අවසර දී ඇති වෙනත් යම් ස්ථානයක සැකකරුවකු රඳවා තබාගෙන විමර්ශනය කිරීම සඳහා එම පනතේ 9(1) වගන්තිය ප්‍රකාර ව ආරක්ෂක අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන රඳවා ගැනීමේ නියෝගයක් මත පමණක් හැකියාව ඇත.

කෙසේ වෙතත්, මෙවැනි රඳවා ගැනීමේ නියෝගයක් ලබා ගැනීම සඳහා ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ සැකකරුවකු අත්අඩංගුවට ගෙන විමර්ශන පැවැත්වීම සඳහා බලය පවරා ඇති නිලධරයකු විසින් පැය 72 ක කාලයක් තුළ කටයුතු කළ යුතු අතර, එසේ රඳවා ගැනීමේ නියෝග ලබා ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීමක් පොලිස්පති මඟින් ආරක්ෂක ලේකම් මඟින් ආරක්ෂක අමාත්‍යවරයා වෙත නියමිත කාලය තුළ ඉදිරිපත් කළ යුතු වේ.

අනවශ්‍ය ප්‍රමාදයන් වැළැක්වීම සඳහා රඳවා ගැනීමේ නියෝග ඉල්ලුම් කිරීමේ දී අදාළ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මඟින් සෘජුවම ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා උපදෙස් ලබා දී තිබුණ ද, එවැනි ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ දී සත්‍ය වශයෙන් ම අත්‍යවශ්‍ය අවස්ථාවල දී පමණක් නොව, සැකකරුවකු රක්ෂිත බන්ධනාගාර ගත කර විමර්ශන සිදු කළ හැකි අවස්ථාවල දී පවා රඳවා තබා ගැනීමේ නියෝග ලබා ගැනීම සඳහා ඉල්ලුම් කරන බව නිරීක්ෂණය වී ඇත.

ඒ අනුව, මින් ඉදිරියට ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ රඳවා ගැනීමේ නියෝග ලබා ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉල්ලුම් කරන අවස්ථාවල දී පහත පරිදි කටයුතු කළ යුතු බව දන්වා සිටිමි.

1. සෑම ඉල්ලීමක් ම බලය පැවරූ පොලිස් අධිකාරී නිලයට නොඅඩු නිලධරයා විසින් සෘජුවම අදාළ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මඟින් මා වෙත ඉදිරිපත් කළ යුතු අතර, මාගේ නිර්දේශ මත පමණක් ආරක්ෂක අමාත්‍යාංශය වෙත එම ඉල්ලීම් යැවිය යුතු ය.

2. ඉහත ඡේද 1 පරිදි කටයුතු කිරීමට ප්‍රායෝගිකව අපහසු වන යම් අවස්ථාවක දී අදාල ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විසින් මා අමතා ලබා ගත් වාචික උපදෙස් මත පමණක් පොලිස්පති වෙනුවට එම ඉල්ලීම් සෘජුව ම ආරක්ෂක අමාත්‍යාංශය වෙත යැවිය යුතු ය.

3. ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාසය හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන රඳවා ගැනීමේ නියෝග ලබා ගැනීමේ ඉල්ලීම් නියෝජ්‍ය පොලිස්පති / අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් මා වෙත යොමු කර, මාගේ නිර්දේශ මත පමණක් ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කළ යුතු ය.

4. ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාසය හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉහත ඡේද 3 පරිදි කටයුතු කිරීමට ප්‍රායෝගිකව අපහසු වන යම් අවස්ථාවක දී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති විසින් මා අමතා ලබා ගත් වාචික උපදෙස් මත පමණක් පොලිස්පති වෙනුවට එම ඉල්ලීම් සෘජුව ම ආරක්ෂක අමාත්‍යාංශය වෙත යැවිය යුතු ය.

5. එලෙස තවදුරටත් එම සැකකරු රඳවා තබා ගන්නේ නම්, ඔහු රඳවා තබා ගෙන විමර්ශන සිදු කිරීමට බැලූ බැල්මට ප්‍රමාණවත් කරුණු අනාවරණය වී ඇති බවට රඳවා තබා ගැනීම නිර්දේශ කර මා වෙත ඉල්ලීම් ඉදිරිපත් කරන නිලධරයන් යැවීමට පත්විය යුතු බව ද අවධාරණය කරමි.

6. කිසිදු හේතුවක් මත ඉහත දක්වා ඇති ක්‍රමවේදයන්ට පරිභාහිරව රඳවා ගැනීමේ නියෝග සඳහා කරනු ලබන ඉල්ලීමක් ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු නොකළ යුතු ය.

7. තව ද, ඉහත දක්වා ඇති උපදෙස් වලට අමතර ව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මා වෙත දන්වා ඇති පරිදි, ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ අත්අඩංගුවට ගන්නා සැකකරුවන් පිළිබඳව පහත සඳහන් පරිදි ක්‍රියා කිරීම අදාළ කොට්ඨාස භාර නිලධාරියාගේ වගකීම වේ.

7.1. යම් තැනැත්තකු සිරභාරයට ගන්නා ලද අවස්ථාවක හෝ රඳවා තබා ගන්නා ලද අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි සිරභාරයට ගැනීම, රඳවා තබා ගැනීම හා රඳවා ගෙන ඇති ස්ථානය එම වේලාවේ සිට පැය 48 ක් නොඉක්මවන කාලයක් තුළ දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු ය.

7.2. ඉහත පරිදි අත්අඩංගුවට ගෙන රඳවා තබා ගෙන ඇති පුද්ගලයකු හෝ එසේ අත්අඩංගුවට ගත් පුද්ගලයකු මුදා හැරීමක් හෝ වෙනත් රැඳවුම් ස්ථානයකට මාරු කිරීමක් සිදු කළ විට ඒ පිළිබඳව ද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු ය.

7.3. එමෙන් ම මින් ඉදිරියට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගැනීම්, රඳවා තබා ගැනීම්, එසේ අත්අඩංගුවට ගත් පුද්ගලයින් මුදා හැරීමක් හෝ රැඳවුම් ස්ථානයෙන් වෙනත් ස්ථානයකට මාරු කිරීමක් යන කරුණුවලට අදාළව ඇමුණුම 01 හි සඳහන් වගුව යටතේ මාසික වාර්තාවක් නියෝජ්‍ය පොලිස්පති / නීති දිසාව සහ සහාපති / ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (මානව හිමිකම් කොමිෂන් සභාවේ ෆැක්ස් අංකය 011 250 5566 වේ) වෙත ද පිටපත් යොමු කිරීමට කටයුතු කළ යුතු ය.

8. එමෙන් ම 2022 අංක 12 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත ප්‍රකාර ව මෙම පනත යටතේ අත්අඩංගුවට ගන්නා සැකකරුවන් පිළිබඳ පහත සඳහන් පරිදි ක්‍රියා කිරීම අදාළ කොට්ඨාස භාර නිලධාරියාගේ වගකීම වේ.

8.1. ඉහත කී සංශෝධන පනතේ 10(අ)(1) වගන්ති ප්‍රකාර ව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රිමාන්ඩ් භාරයේ හෝ රැඳවුම් භාරයේ සිටින තැනැත්තකු හට මෙම පනත යටතේ සාදන ලද නියෝග වලින් නියම කරනු ලැබිය හැකි කොන්දේසි වලට යටත් ව හෝ වෙනත් ලිඛිත විධිවිධාන සලස්වා දී ඇති ආකාරයට එම තැනැත්තා නියෝජනය කරන නීතිඥවරයකු හමු වීමේ හැකියාව ඇත.

8.2. ඉහත කී සංශෝධන පනතේ 10(අ)(2) වගන්ති ප්‍රකාර ව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රිමාන්ඩ් භාරයේ හෝ රැඳවුම් භාරයේ සිටින තැනැත්තකු හට ලිඛිත නීතියේ විධිවිධාන සලස්වා ඇති පරිදි ඔහුගේ ඥාතීන් සමඟ සන්නිවේදනය කිරීමේ අයිතිය තහවුරු කළ යුතු ය.

ඉහත සඳහන් උපදෙස් වලට පටහැනි ආකාරයට රඳවා ගැනීමේ නියෝග ලබා ගැනීම සඳහා ඉල්ලීම් කරනු ලබන නිලධරයන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළහැකිබව දන්වා සිටිමි.

සී.ඩී. වික්‍රමරත්න
පොලිස්පති

ඒ. ඔ. විතුමරත්න
පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ 01.

පිටපත : ගොකුවට
දෙමේ-

ඇමුණුම - 01

ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත (PTA) යටතේ අත්අඩංගුවට ගෙන රඳවා සිටින රැඳවියන් පිළිබඳ වාර්තාව

නම	ලිපිනය	අත්අඩංගුවට			දැනට රඳවා ඇති ස්ථානය	වර්ථමාන තත්ත්වය
		ගැනීමට හේතුව	ගත් දිනය හා ස්ථානය	ගත් නිලධරයන්		
						1. රැඳවුම් නියෝග මත සිටින්නේ නම් රැඳවුම් අංකය හා කාලය 2. බන්ධනාගාර ගත කර ඇත්නම් බන්ධනාගාර ගත කළ දිනය, රඳවා ඇති බන්ධනාගාරය, නඩු අංකය, නඩුවේ වර්ථමාන තත්ත්වය 3. නිදහස් කර ඇත්නම් නිදහස් කළ දිනය 4. ඇප ලබා දී ඇත්නම් ඇප ලබාදුන් දිනය